**වධහිංසාවට එරෙහි ශ්‍රී ලංකා එකමුතුව**
**சித்திரவதைக்கு எதிரான இலங்கை ஒன்றிப்பு**
**SRI LANKAN COLLECTIVE AGAINST TORTURE**

No: 288/135, Jayawardana Place, Baseline Road, Colombo - 09, Sri Lanka.
+94 112 669100 slcattorture@gmail.com www.slcat.org

SLCAT


**''සිරකරුවන්ගේ අයිතීන් සුරැකීමේ කමිටුවේ සභාපතිවරයා විසින් සිදුකරන ලද අසත්‍ය මාධ්‍ය ප්‍රකාශය ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාව විසින් හෙළාදකියි'' යන මැයෙන් නිකුත් කළ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රකාශයට ප්‍රතිචාර දැක්වීම**

ශ්‍රීලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2022 ජූනි 30 වැනිදින නිකුත් කරන ලද ''සිරකරුවන්ගේ අයිතීන් සුරැකීමේ කමිටුවේ සභාපතිවරයා විසින් සිදුකරන ලද අසත්‍ය මාධ්‍ය ප්‍රකාශය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් හෙළාදකියි'' යන මැයෙන් නිකුත් කරන ලද ප්‍රකාශය සම්බන්ධයෙන් වධහිංසාවට එරෙහි ශ්‍රී ලංකා එකමුතුව (Sri Lankan Collective Against Torture - SLCAT) දැඩි ලෙස කනස්සල්ලට පත්වසිටී.

2022 මැයි 9 වැනි දින සාමකාමී විරෝධතාකරුවන්ට පහරදීම සඳහා බන්ධනාගාරගතව සිටින පුද්ගලයන් යොදාගත් බවට සිරකරුවන්ගේ අයිතීන් සුරැකීමේ කමිටුවේ සභාපති සේනක පෙරේරා මහතා කළ චෝදනාව සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවස්වකීය විමර්ශනය අවසන් කරමින් මානව හිමිකම් ආරක්ෂකයින්ගේ ආරක්ෂාවට,සුරක්ෂිතතාවට මෙන්ම, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට හානිකර බොහෝ ප්‍රකාශ සහ චෝදනා ඉදිරිපත් කරනු ලබයි.

විශේෂයෙන්ම, පෙරේරා මහතාගේ ප්‍රකාශය 'දිවයින පුරා වාර්තා වූ ප්‍රචණ්ඩ ක්‍රියා සහ අයිතිවාසිකම් කඩවීම් මාලාවට සෘජුවම දායකවූ' බව කොමිසම විසින් ප්‍රකාශ කරනු ලබයි. මෙසේ සිදුකර ඇති චෝදනාව සම්බන්ධයෙන් වධහිංසාවට එරෙහි ශ්‍රී ලංකා එකමුතුව විමතියට පත්ව ඇති අතර, එය සාක්ෂි මත පදනම් නොවන බැවින් වගකීම් විරහිත ප්‍රකාශයක් ලෙස සලකන අතර එමගින් රටපුරා ඇති වූ ප්‍රචණ්ඩත්වයේ වගකීම වැරදි ලෙස පෙරේරා මහතා මත පටවනු ලැබීමට උත්සාහ කරන බව පෙන්වාදෙනු ලැබේ. විසම්මුතිය මැඩලීමට සහ ආණ්ඩුවට අභියෝග කරන ක්‍රියාකාරීන් ඉලක්කකර ගැනීමට ආණ්ඩුව විසින් නීතිය මෙවලමක් කරගනිමින් සිටින මොහොතක, පෙරේරා මහතාගේ පමණක් නොව, පොදුවේ මානව හිමිකම් ආරක්ෂා කරන්නන්ගේ ක්‍රියාකාරකම් යටපත් කිරීමට මෙවැනි චෝදනාවක් ආණ්ඩුවට යොදාගත හැකිය. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස මැඩලීමට රජය දරන උත්සාහයන් කොමිෂන් සභාව මගින් සක්‍රීය කිරීමට දායකවීම සම්බන්ධයෙන් වධහිංසාවට එරෙහි ශ්‍රී ලංකා එකමුතුව වික්ෂිප්තභාවයට පත්ව ඇත.

නීතියේ ආධිපත්‍යය උල්ලංඝනය කිරීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරුකර ඇති මූලික අයිතිවාසිකම්වලට එනම්, පාලක පක්ෂයට පක්ෂපාතී පුද්ගලයින් විසින් සාමකාමී විරෝධතාකරුවන්ට පහරදීම සහ එවැනි ප්‍රහාරයක් වැළැක්වීමට පොලිසිය අසමත්වීම වැනි තර්ජනවලට වඩා ''නීතියේ ආධිපත්‍යය රකින ජාතියක් ලෙස, රටේ යහපත් ප්‍රතිරූපයට ආපසු හැරවිය නොහැකි අන්දමේ අපකීර්තියක්" වී ඇති බවට මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ස්වකීයකර්තව්‍යය වශයෙන් ඇති මානව හිමිකම් කොමිෂන් සභාව සිතීම සම්බන්ධයෙන් අපි කණගාටුවටපත්වන්නෙමු.

පොලීසිය සහ හමුදාව වැනි රාජ්‍ය ආරක්ෂක අංශ විසින් සිදුකරන අපයෝජනයන් දිනපතාම පාහේ වාර්තා වෙමින් පවතින මොහොතක, එවන් සිද්ධීන් පිළිබඳ කොමිසමේ විමර්ශනයන් ඔස්සේ මේ වනතෙක් කිසිඳු රාජ්‍ය ආයතනයකට වාර්තා කිරීම හෝ ඒවා සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කර නොමැති බව වධහිංසාවට එරෙහි ශ්‍රී ලංකා එකමුතුව විසින් මෙහිදී සඳහන් කර සිටී. නිදසුනක් වශයෙන්, මැයි 9 වැනිදා සාමකාමී විරෝධතාකරුවන්ට එරෙහිව සිදු කරන ලද ප්‍රචණ්ඩත්වය, රඹුක්කන්න සිද්ධිය හෝ පොලිසිය සහ ත්‍රිවිධ හමුදාව විසින් දිගින් දිගටම සිදු කරන පුරවැසි අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් කොමිසම තවමත් නීතිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට කටයුතුකර නොමැත. එහෙත්, මෙම අවස්ථාවේදී පරීක්ෂණය කඩිනමින් අවසන්වූ අතර මානව හිමිකම් සම්බන්ධයෙන් කටයුතු කරන නීති වෘත්තිකයෙකු කොමිසම විසින් අපරාධකරුවෙකු ලෙස අර්ථ දැක්වීමට කටයුතු කර ඇත.

No: 288/135, Jayawardana Place, Baseline Road, Colombo - 09, Sri Lanka.
+94 112 669100 slcattorture@gmail.com www.slcat.org

විසම්මුතිය මර්දනය කිරීමේ අරමුණින් යුතුව සිවිල් ක්‍රියාකාරීන් සහ මාධ්‍යවේදීන් ඇතුළු තවත් අය ඉලක්කකර ගනිමින් කලින්කලට බලයට පත්වූ රජයන් විසින් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිපනත වැනි නීති අනිසි ලෙස භාවිත කරන සන්දර්භය තුළ, පෙරේරා මහතාගේ ප්‍රකාශය විමර්ශනයකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස කොමිසම විසින් නීතිපතිවරයාට නිර්දේශ කිරීමට පියවර ගැනීම පිළිබඳව වධහිංසාවට එරෙහි ශ්‍රී ලංකා එකමුතුව කම්පනයට පත්වී ඇත.

වාණිජමය පසුබිමක් සහිත ව්‍යවසායන් විසින් සිරගත කරන ලද පුද්ගලයින් ස්වකීය ආයතනයන්හි ශ්‍රමය සඳහා යොදාගැනීමෙන්, තමන් වෙනුවෙන් හඬක් නැගීමට හෝ ප්‍රමාණවත් වැටුප් හෝ ආරක්ෂිත සේවා කොන්දේසි ඉල්ලා සිටීමට තරම් බලයක් නොමැති එවැනි පුද්ගලයන් සූරාකෑමට ලක්විය හැකි බව වධහිංසාවට එරෙහි ශ්‍රී ලංකා එකමුතුව විසින් මානව හිමිකම් කොමිෂන් සභාවට අවධාරණය කිරීමට කැමතිය. එවැනි තත්ත්වයන් යටතේ, බොහෝ අවස්ථාවලදී නීතිය උල්ලංඝණය කළ බවට චෝදනා එල්ලවී ඇති පාලන තන්ත්‍රයට සමීප සම්බන්ධකම් සහිත හිමිකාරීත්වයක් ඇති ඇවන්ගාඩ් මැන්පවර් ආයතනය සම්බන්ධයෙන් අවධානය යොමුකර, ඒ පිළිබඳව විමසා සමාලෝචනයක් සිදු කිරීමට අවශ්‍ය පියවර කොමිෂන් සභාව විසින් ගතයුතුව තිබුණි. ඒ වෙනුවට, සිරගතව සිටින පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සොයාබැලීමකින් හෝ සැලකිල්ලකින් තොරව කොමිසම විසින් පවතින තත්ත්වය පිළිගෙන තිබෙන බව මෙහිදී සඳහන් කළ යුතු වේ.

අදාළ විමර්ශන ක්‍රියාවලියේ විනිවිදභාවය සහ ස්වාධීනත්වය සහතික කිරීමේ අවශ්‍යතාව උදෙසා, අදාළ විමර්ශන කමිටුව පත්කරන ලද ක්‍රියාවලිය සහ විමර්ශකයින්ගේ පසුබිම සහ සුදුසුකම් ප්‍රසිද්ධියට පත් කරන ලෙස වධහිංසාවට එරෙහි ශ්‍රී ලංකා එකමුතුව විසින් මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටී. වධහිංසාවට එරෙහි ශ්‍රී ලංකා එකමුතුව විසින් මෙම ප්‍රශ්නය මතුකරනු ලැබීමට හේතුපාදක වන්නේ, බරපතල වංචා දූෂණ විමර්ශන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව (Presidential Commission of Inquiry Appointed to Investigate Serious Acts of Fraud and Corruption - PRECIFAC) විසින් පෙන්වාදී ඇති පරිදි ඇවන්ගාඩ් සහ රක්නා ලංකා යන ආයතනයන්හි අවිධිමත් මූල්‍ය ගනුදෙනු සම්බන්ධයෙන් අපරාධ චෝදනාවන් ඉදිරිපත් කළ යුතු බවට නිර්දේශකර ඇති පුද්ගලයන් දහතුන් දෙනාගෙන් එක් අයකු හිටපු අමාත්‍ය රෝහිත බෝගොල්ලාගමගේ දියණිය වන වෛද්‍ය දිල්ෂානි බෝගොල්ලාගම වීම හේතුවෙනි. වර්තමානයේ පවතින පරීක්ෂණය ඇවන්ගාඩ් සමාගමට සම්බන්ධ බැවින් විමර්ශනයේ ස්වාධීනත්වය අවතක්සේරුවට ලක්වන අන්දමේ ලැඳියාවන් අතර පිළිගැටුමක් ඇති විය හැකිය. තවද, පහරදීමක් පිළිබඳව වෛද්‍ය දිල්ෂානි බෝගොල්ලාගම සම්බන්ධයෙන් චෝදනා එල්ලවී 2018 වසරේදී ඇයට එරෙහිව අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුවක්[1] නිකුත්කර තිබීම හේතුවෙන් උක්ත විමර්ශන ක්‍රියාවලියේ සුපිළිපන්භාවය තවදුරටත් අනතුරට ලක්ව ඇත. එවැනි පරීක්ෂණ සිදු කරන අය අවංකභාවයෙන් යුත් පුද්ගලයන් වීම මෙන්ම නීතිය උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් චෝදනා එල්ලවී නොමැති තැනැත්තන් වීම අත්‍යවශ්‍ය බවවධහිංසාවට එරෙහි ශ්‍රී ලංකා එකමුතුව විසින් අවධාරණයකර සිටී.

විමර්ශන ක්‍රියාවලියක් ස්වාධීනවීම පමණක් නොව එය ස්වාධීන බව විද්‍යමාන වීමද අත්‍යවශ්‍ය බව වධහිංසාවට එරෙහි ශ්‍රී ලංකා එකමුතුව විසින් නැවත අවධාරණය කරනු ලබයි. පෞද්ගලික වාසි ලබාගැනීමට සහ නියමිත ක්‍රියාවලිය මඟහැරීම සඳහා පවුල් සහ පෞද්ගලික සබඳතා බහුලව භාවිත කරන පසුබිමක් ඇති ශ්‍රී ලංකාවේ, පැහැදිලි වශයෙන්ම ලැඳියාවන් සම්බන්ධයෙන් පිළිගැටුමක් පෙන්නුම් කෙරෙන එවැනි පත්වීමක්, අදාල විමර්ශන ක්‍රියාවලියේ ස්වාධීනත්වය සහ සුපිළිපන්භාවය සම්බන්ධයෙන් ප්‍රශ්නකාරී තත්ත්වයක් ඉස්මතු කරනු ලබයි. මෙමගින් අදාළ විමර්ශනය කෙරෙහි මෙන්ම මානව හිමිකම් කොමිෂන් සභාව කෙරෙහි පවතින මහජන විශ්වාසයද පළුදුවීමට හේතු වේ.

7/6/2022

[1] http://www.independent.lk/arrest-order-issued-bogollagamas-wife-daughter/